LOLC ෆිනෑන්ස්
(LOLC සමූහ ව්‍යාපාරයට අනුබද්ධිතයි)
Consumer Business Centre, අංක 440, හැව්ලොක් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව
පාරිභෝගික සේවා: +94 115718888
වෙබ් අඩවිය: www.lolcfinance.com විද්‍යුත් තැපැල්: cards@lolcfinance.com

Advertisement

# LOLC ෆිනෑන්ස් ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම් ප්‍රකාශනය

2016 නොවැම්බර් 08 දින සිට 2016 දෙසැම්බර් 07 දක්වා ගිණුම් ප්‍රකාශනය

## ගිණුම් සාරාංශය

| ගිණුම් සාරාංශය | + මිලදී ගැනීම් සහ වෙනත් තොරතුරු | + මුදල් අත්තිකාරම් | - ගෙවීම් සහ වෙනත් බැර | අවසාන ශේෂය |
|---|---|---|---|---|
| | | | | |

| | | | |
|---|---|---|---|
| **කාඩ්පත් අංකය** | | **ගෙවීම් නියමිත දිනය** | |
| **ණය සීමාව** | | **පෙර ගෙවිය යුතු මුදල** | |
| **මුදල් සීමාව** | | **ගෙවිය යුතු අවම මුදල** | |

## ගනුදෙනු පිළිබඳ තොරතුරු

| සටහන් දිනය | ගනුදෙනු දිනය | විස්තරය | මුදල් වර්ගය | මුදල | මුදල (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|---|---|---|---|

-ප්‍රකාශනයේ අවසානය-

..........කරුණාකර මෙම කොටස වෙන්කර, ඔබගේ ගෙවීම් සමග ඉදිරිපත් කරන්න..........

නම:

ලිපිනය:

| | | | | | |
|---|---|---|---|---|---|
| කාඩ්පත් අංකය | | | | | |
| ගෙවන ලද මුදල (ශ්‍රී ලංකා රු.) | | චෙක්පත් | | මුදල් | |
| මුදල අකුරින් | | | | | |
| චෙක්පත් අංකය | | බැංකුව | | ශාඛාව | |
| දිනය | දි දි මා මා ව ව ව ව | | | | |

අවම ගෙවීම පමණක් සිදුකරන ලද්දේ නම්, අවසන් පිටුවෙහි දක්වා ඇති ආකාරයට පොලිය උපචිත වනු ඇත.
පොලී රහිත දින අදාළ වන්නේ නියමිත දින හෝ ඊට පෙර සම්පූර්ණ ගෙවීම සිදුකර ඇති විට වන අතර, එය මුදල් අත්තිකාරම් සඳහා අදාළ නොවේ.

# ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශනය පිළිබඳ වැදගත් තොරතුරු

## 1) ඔබගේ ක්‍රෙඩිට් කාඩ් බිල්පත් ගෙවීම්

කරුණාකර ඔබේ ක්‍රෙඩිට් කාඩ් බිල්පත පියවීම සඳහා පහත සඳහන් විකල්ප භාවිත කරන්න:

a) **මුදල් මගින් ගෙවීම**
මුදලින් ගෙවීම් ඕනෑම LOLC ශාඛාවක දී සිදුකළ හැකිය. කරුණාකර තැපැල් මගින් මුදල් එවීමෙන් වලකින්න. සෙනසුරාදා දිනවලදී සිදුකරන ගෙවීම් ඊළඟ වැඩකරන දිනයේ දී සැකසෙනු ඇත.

b) **ස්ථාවර නියෝග**
ගිණුම් හිමියෙකු හට, ස්ථාවර නියෝග ලබාදීමේ පහසුකම හරහා ඔහුගේ කාඩ්පත් ගිණුම පියවීම සඳහා සිය LOLC ෆිනෑන්ස් ඉතිරිකිරීමේ ගිණුම හර කළ හැකිය. ගෙවීම් නියමිත දිනට ප්‍රකාශන ශේෂයෙන් 4%-100% දක්වා ප්‍රතිශතයක් හර කිරීම සඳහා ඔබට තෝරාගැනීමට හැකිය.

c) CEFTS **ඕනෑම වෙනත් බැංකුවක් හරහා ගෙවීම්**
CEFTS හරහා වෙනත් බැංකුවල ඉතුරුම්/ජංගම ගිණුම් වෙතින් ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම වෙත මුදල් මාරු කිරීම කාඩ්පත් හිමියා හට සිදුකළ හැකිය.

d) LOLC REAL TIME
LOLC ෆිනෑන්ස් සමග ඇති ඔබගේ ඉතිරි කිරීමේ ගිණුමෙන් ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට නොමිලේ මුදල් හුවමාරු කිරීමට තත්කාල ගෙවීම් භාවිත කරන්න.

e) iPay
ඔබගේ LOLC ඉතිරිකිරීමේ ගිණුම හෝ වෙනත් බැංකු ගිණුමක් iPay හරහා සම්බන්ධ කර මාර්ගගත ක්‍රමයෙන් පහසුවෙන් ගෙවීම් කල හැකිය.

f) mCash
දිවයින පුරා විහිදුනු බලයලත් mCash නියෝජිතයින් හරහා මුදල් මාර්ගයෙන් ගෙවීමේ හැකියාව.

g) **චෙක්පත් මගින් ගෙවීම්**
චෙක්පත් රේඛනය කළ යුතුය. (ආදායකයාගේ ගිණුමට පමණයි) එහි කාඩ්පත් අංකය ද ඇතුළත් විය යුතුය. උදා - LOLC ෆිනෑන්ස් පීඑල්සී වෙත ගෙවන්න. කාඩ්පත් අංකය 0000 0000 0000 0000 කාඩ්පත් හිමියාගේ නමට ලියන ලද තෙවන පාර්ශවයේ චෙක්පත්, ඒවා ඉහත උදාහරණයේ පරිදි ලියා ඇත්නම් හැර, භාර නොගැනේ. උපලබ්ධි වීමට යටත්ව ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි මුදල් ලබාගැනීමට පවතිනු ඇත. චෙක්පත් සැකසීමට හා නිෂ්කාසනය සඳහා කරුණාකර වැඩ කරන දින තුනක අවම කාලයක් සහ වැඩ කරන දින හයක උපරිම කාලයක් ලබාදෙන්න. මුදල් චෙක්පත් සහ මතුදාතම් යෙදූ චෙක්පත් ගෙවීම් සඳහා භාර නොගැනෙනු ඇත. ගෙවීම් තැපැල් මගින් එවන ලද්දේ නම් කරුණාකර එම ගෙවීම් ඔබගේ ගිණුම වෙත ළඟා වීම සඳහා දින නවයක කාලයක් ලබාදෙන්න. සියලුම ලිපි, කළමනාකරු - Consumer Business Centre, අංක 438, හැව්ලොක් පාර, කොළඹ 05 වෙත යොමු කළ යුතුය.

## 2) ගෙවිය යුතු අවම මුදල

ගෙවිය යුතු සමස්ත අවම මුදලට පහත දෑ ඇතුළත් වනු ඇත:

a) සමස්ත හිඟ මුදලින් 4%ක් හෝ රු.100ක් යන ඒවායින් වැඩි අගය.
b) ක්‍රෙඩිට් කාඩ්පතෙහි ණය සීමාවට ඉහළින් පවතින ගෙවිය යුතු යම් මුදලක්.
c) පසුගිය මාසයේ (මාසවල) නොගෙවූ / හිඟව පවතින, ගෙවිය යුතු අවම මුදලක්.
d) ස්ථාවර මාසික වාරික (සමාන මාසික වාරික)
හෝ
e) LOLC ෆිනෑන්ස් පීඑල්සී විසින් උපදෙස් දී ඇති පරිදි.

## 3) ගෙවීම් නියමිත දිනය

ප්‍රකාශනයෙහි ඉදිරිපස දක්වා ඇති යම් අවම මුදලක් මෙම දිනය වන විට ගෙවිය යුතු වේ. ගෙවීම් නියමිත දිනයට ඔබගේ ගෙවීම නොලැබුණහොත් හෝ ගෙවිය යුතු අවම මුදල නොගෙවුවහොත්, ඔබගේ කාඩ්පත් ගිණුමෙන් ප්‍රමාද ගෙවීම් ගාස්තුවක් අය කෙරනු ඇත.

## 4) ප්‍රමාද ගෙවීම් මූල්‍ය ගාස්තු

ගෙවිය යුතු අවම මුදල, ගෙවීම් නියමිත දිනට හෝ එදිනට පෙර නොලැබුණහොත්, පහත දක්වා ඇති අනුපාතික මත ප්‍රමාද ගාස්තුවක් කාඩ්පත් ගිණුම වෙත අයකෙරෙනු ඇත.

මාස්ටර්කාඩ් පල්ස් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 750/-
මාස්ටර්කාඩ් ගෝල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 750/-
මාස්ටර්කාඩ් ප්ලැටිනම් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 1,000/-
මාස්ටර්කාඩ් ව(ර්)ල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 1,500/-

## 5) සීමාව ඉක්මවීමේ ගාස්තුව

ප්‍රකාශන චක්‍රය තුළ ඕනෑම වේලාවකදී ක්‍රෙඩිට් කාඩ්පත් සීමාව ඉක්මවා ඇත්නම්, පහත දක්වා ඇති අනුපාතික මත සීමාව ඉක්මවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුම වෙත අයකෙරෙනු ඇත.

මාස්ටර්කාඩ් පල්ස් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 750/-
මාස්ටර්කාඩ් ගෝල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 750/-
මාස්ටර්කාඩ් ප්ලැටිනම් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 1,500/-
මාස්ටර්කාඩ් ව(ර්)ල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 2,000/-

## 6) මුදල් අත්තිකාරම් ගාස්තුව

ගනුදෙනු වටිනාකමින් 6%ක් හෝ රු.500/ක් යන අගයයන් අතරින් ඉහළ අගය මත මුදල් අත්තිකාරම් ගාස්තුවක් ගණනය කෙරෙනු ඇත..

## 7) මූල්‍ය ගාස්තු

සමස්ත වත්මන් ශේෂය, ගෙවීම් නියමිත දින හෝ ඊට පෙර ගෙවන ලදහොත්, ගනුදෙනු (මුදල් අත්තිකාරම් හැර) මත කිසිදු මූල්‍ය ගාස්තුවක් අය නොකෙරේ. ගෙවීම් නියමිත දිනයේ දී අර්ධ ගෙවීමක් පමණක් සිදුකළහොත් හෝ කිසිදු ගෙවීමක් නොකළහොත් හෝ, ගෙවීමක් සිදුකළ ද එය ගෙවීම් නියමිත දිනට පසුව සිදුකළහොත්, LOLC ෆිනෑන්ස් පීඑල්සී හි වර්තමාන මාසයේ පොලී අනුපාතයට අනුව දෛනික ශේෂය මත ගණනය කරන (එක් එක් ගනුදෙනුවට අදාළ ගනුදෙනු දිනවල සිට) මූල්‍ය ගාස්තුවක්, සම්පූර්ණයෙන් මුදල පියවන තෙක් නව මිල දී ගැනීම් ද ඇතුළත්ව පසුගිය ප්‍රකාශන ශේෂයට අදාළ කෙරෙනු ඇත.

මුදල් අත්තිකාරම්, මුදල් අත්තිකාරම් ගාස්තුවකට යටත් වේ. මුදල් අත්තිකාරම් සඳහා, ගනුදෙනු දිනයේ සිට සම්පූර්ණ ආපසු ගෙවීම දක්වා, මූල්‍ය ගාස්තුවක් අය කෙරෙනු ඇත. අර්ධ ගෙවීමක් පමණක් ලැබුණහොත්, පහත පරිදි මූල්‍ය ගාස්තු ගණනය කෙරෙනු ඇත:

### පොලී ගණනය කිරීමේ උදාහරණය

ප්‍රකාශන දිනය 2019/06/01 සහ ගෙවීම් නියමිත දිනය 2019/06/16

| දිනය | විස්තරය | ගනුදෙනු මුදල | ශේෂය |
|---|---|---|---|
| 02/06/2019 | ආරම්භක ශේෂය | | 10,000 |
| 10/06/2019 | මිලදී ගැනීම් | 1,000 | 11,000 |
| 16/06/2019 | ගෙවීම් | -3,000 | 8,000 |
| 01/07/2019 | කාලසීමාව සඳහා පොලිය* | 225.21 | |
| 01/07/2019 | අවසන් ශේෂය | | 8,225.21 |

| පොලිය ගණනය කිරීම* | | | | |
|---|---|---|---|---|
| දින පරාසය | ශේෂය | *අනුපාතය | දින ගණන | ප්‍රතිපාදිත පොලී මුදල |
| 02/06/2019 දින සිට 09/06/2019 | 10,000 | 30% | 8 | 65.75 |
| 10/06/2019 දින සිට 15/06/2019 | 11,000 | 30% | 6 | 54.25 |
| 16/06/2019 දින සිට 01/07/2019 | 8,000 | 30% | 16 | 105.21 |
| මුළු මුදල | | | | 225.21 |

*ආදර්ශ අනුපාත අගයක් පමණි

## 8) කාඩ්පත් නැතිවීම පිළිබඳ වගකීම්

කාඩ්පත නැතිවීම LOLC ෆිනෑන්ස් පීඑල්සී කාඩ්පත් මධ්‍යස්ථානය වෙත වාර්තා කිරීමට පෙර කාඩ්පත් ගිණුමෙන් අය කරන ලද සියලුම කාඩ්පත් ගනුදෙනු (අවසර දුන් හෝ නොදුන්) සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වේ.

## 9) විදේශ ගනුදෙනු බිල්පත් සඳහා විනිමය අනුපාත

සියලුම විදේශ ගනුදෙනු MasterCard විනිමය අනුපාත භාවිත කර පරිවර්තනය කෙරෙනු ඇත. දේශීය විනිමය අනුපාත විචලනයන් පාලනය කර ගැනීම සඳහා, (3.5% ක් දක්වා) අතිරේක මුදලක් බිල්ගත කරන අවස්ථාවේ දී අනුපාතයට ඇතුළත් කෙරෙනු ඇත.